---

දෙහිඕවිට ප්‍රාදේශීය සභාව

………………………..

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2012 අප්‍රේල් 04 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2011 මාර්තු 31 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2012 ජූනි 15 දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදී.

1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත් සභාපතිවරයා  වෙත යවන ලද මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2011 දෙසැම්බර් 31 දිනට දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 5,378,816 ක්  වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 8,866,868  ක් විය.

2.2 මූල්‍ය පාලනය

බැංකු ගිණුම් දෙකක බැංකු සැසඳුම් පිළියෙල කිරීමේ දීර්ඝ ප්‍රමාදයක් විය.

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. 000 | රු. 000 | රු. 000 |
| (i) වරිපනම් හා බදු | 3,242 | 2,234 | 1,008 |
| (ii) බදු කුලී | 7,083 | 4,179 | 2,904 |
| (iii) බලපත්‍ර ගාස්තු | 840 | 771 | 69 |
| (iv) වෙනත් ආදායම් | 31,488 | 21,500 | 9,938 |

2.3.2 උසාවි දඩ

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2011 දෙසැම්බර් 31 දිනට රු. 2,451,336 ක උසාවි දඩ මුදල් ලැබිය යුතුව තිබුණි.

2.4 අයවීමට ඇති සේවක ණය

2011 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ සේවක ණය අත්තිකාරම් ශේෂ වල එකතුව රු. 3,924,905 ක් වූ අතර, අවුරුදු 01 ක කාලයක් ඉක්මවා අයවීමට හිඟහිටි ගිණුම් ශේෂවල එකතුව රු. 3,847,955 ක් විය.

2.5 මෙහෙයුම් අකාර්යක්ෂමතා

2011 මැයි 30 දිනැති අංක 468 දරන ගෙවීම් වවුචරය මගින් රු. 48,695 ක මුදලක් විදුලි උපකරණ මිලට ගැනීම වෙනුවෙන් ගෙවා තිබුණද 2011 ඔක්තෝබර් 15 දින දක්වා අදාල භාණ්ඩ ගබඩාවට ලැබී නොතිබුණි.

2.6 කොන්ත්‍රාත් පරිපාලනය

රු. 491,380 ක වියදමක් යටතේ මානියංගම වෙහෙරගල සංචාරක ස්ථානය සඳහා ප්‍රවේශ මාර්ගය ඉදි කිරීමේදී පඩිපෙල දෙපස රැඳවුම් තාප්පය 1.2.4 කොන්ක්‍රීට් මිශ්‍රණය අතරට 6" x 9" ප්‍රමාණයේ කබොක් ගල් යොදා සකස් කර තිබූ බව නිරීක්ෂණය විය.

2.7 අභ්‍යන්තර විගණනය

ආයතනය තුල ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.